සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
**Provincial Department of Education - NWP**

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

**දෙවන වාර පරීක්ෂණය - 2025**
**Second Term Test - 2025**

| 9 ශ්‍රේණිය | භූගෝල විද්‍යාව | කාලය පැය 02 යි |
|---|---|---|

නම/ විභාග අංකයඃ

## I - කොටස

සැලකිය යුතුයි

- **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.**
- **අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරන්න.**

01. 1 : 50 000 පරිමාණයේ සිතියමක දැක්වෙන සංස්කෘතික ලක්ෂණයක් දැක්වෙන පිළිතුර තෝරන්න.
   (1) වාරිමාර්ග ඇල (2) ගංගාව
   (3) කඳුවැටි (4) වනාන්තර

02. ආසියානු කලාපයේ සුවිශේෂත්වයක් ලෙස සැලකිය නොහැකි වරණය තෝරන්න.
   (1) විශාලත ම මහද්වීපය වීම. (2) ආගම් රැසක නිජබිම වීම.
   (3) සියලු ම දේශගුණ වර්ග පැවතීම. (4) ලොව දිගම ගංගාව පැවතීම.

03. හිමාලයා වැටියේ උසින් දෙවන ස්ථානය උසුලන කඳුවැටිය කුමක් ද?
   (1) එවරස්ට් (2) මනස්ලු (3) කන්චන්ජුන්ගා (4) ධවලගිරි

04. ආසියාවේ විශාලත ම වාරිමාර්ග පද්ධතියක් සහිත රටක් ලෙස සැළකිය හැක්කේ,
   (1) ඉරානය (2) ඉන්දියාව (3) පාකිස්ථානය (4) බංග්ලාදේශය

05. ලෝකයේ පියස්ස ලෙසින් හැඳින්වෙන සානුව දැක්වෙන පිළිතුර තෝරන්න.
   (1) ටිබෙට් සානුව (2) ඉරාන සානුව (3) පාමීර් සානුව (4) ඩෙකෑන් සානුව

- **අංක 06 සිට 10 දක්වා ප්‍රශ්නවල දැක්වෙන ප්‍රකාශ හරි නම් (✓) ලකුණ ද, වැරදි නම් (✗) ලකුණ ද ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.**

06. අමූර්, හොවැංහෝ, යැංසි යන ගංගා පැසිපික් සාගරයට ගලා බසී. ( )

07. බයිකල් විල ලෝකයේ ගැඹුරුම මිරිදිය විල ලෙස සැළකේ. ( )

08. ආසියාවේ දිගම ගඟ හොවැංහෝ ගඟයි. ( )

09. ආසියාවේ ඉහළ ම වර්ෂාපතනය වාර්තා වන්නේ පාකිස්ථානයේ ජකෝබාබාද් වලිනි. ( )

10. ඉන්දු නිම්න ශිෂ්ටාචාරය ආසියාවේ පිහිටි ඉපැරණි ශිෂ්ටාචාරයකි. ( )

- **අංක 11 සිට 15 දක්වා ප්‍රශ්න සඳහා නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා හිස්තැන් පුරවන්න.**

11. ආසියා මහද්වීපයේ දක්නට ලැබෙන දේශගුණ වර්ග අතරින් ලංකාව, ඉන්දියාව, මියැන්මාරය වැනි රටවල ............................................................................ දේශගුණ වර්ගය ව්‍යාප්ත වේ. (නිවර්තන වාර්ෂා, නිවර්තන මෝසම්, නිවර්තන සැවානා)

12. සෞම්‍ය කලාපීය දේශගුණයක් සහිත කලාප වල ............................................................... වනාන්තර ව්‍යාප්තව ඇත. (නිවර්තන, කේතුධර, පතනශීලී)

13. මොංගොලොයිඩ් මානව වර්ගය ව්‍යාප්ත රටකට උදාහරණයක් ලෙස ............................................................... දැක්විය හැකිය. (ඉන්දියාව, ඉරානය, ජපානය)

14. මිහින්තලය, සීගිරිය වැනි ශේෂ කඳු ව්‍යාප්තව ඇත්තේ ............................................................. භූ විෂමතා කලාපය ආශ්‍රිතවය. (වෙරළබඩ තැන්න, අභ්‍යන්තර තැනිතලා, මධ්‍යම කඳුකර)

15. කුඹුක්කන් ඔය ලංකාවේ ........................................................................................ දිශාවෙන් මුහුදට ගලා බසී. (වයඹ, ගිණිකොන, නිරිත)

- **අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර හිස්තැන මත ලියන්න.**

16. ශ්‍රී ලංකාවේ ගංගාවල දිග අනුව ............................................................... ට හිමි වන්නේ සිව්වන ස්ථානය යි.

17. පාකිස්ථානයේ අප්‍රේල් සිට ඔක්තෝම්බර් දක්වා ක්‍රියාත්මක වන වගා කන්න ..................................................... ලෙස හැඳින් වේ.

18. මධ්‍යම කඳුකර කලාපයේ උෂ්ණත්වය අඩු වී ඇත්තේ ................................................................... හේතුවෙනි.

19. ශ්‍රී ලංකාවට සංවහන, මෝසම් හා ......................................................................... මගින් වර්ෂාපතනය ලැබේ.

20. මන්නාරම හා හම්බන්තොට ප්‍රදේශ ආශ්‍රිතව .............................................................. දේශගුණය ව්‍යාප්ත වේ.

(2 x 20 = ල. 40)

## II - කොටස

**සැලකිය යුතුයි**

- **පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න 04 කට පිළිතුරු සපයන්න.**


01. (i) A, B, C, D, E අක්ෂරවලින් දක්වා ඇති ලක්ෂණ නම් කරන්න. (ල. 05)

(ii) පහත සංස්කෘතික ලක්ෂණ නිරූපණයට භාවිතවන සංකේත නියමිත වර්ණයෙන් ඇද දක්වන්න. (ල. 03)

පාසල / හෝටලය / පොලීසිය

(iii) මෙම සිතියමේ දක්නට ලැබෙන භෞතික ලක්ෂණ දෙකක් නම් කරන්න. (ල. 02)

(iv) සිතියමක දැක්වෙන වෙරළ ලක්ෂණ තුනක් නම් කරන්න. (ල. 03)




(v) සිතියමක දැක්වෙන ජලවහන ලක්ෂණ තුනක් නම් කරන්න. (ල. 03)

02. (i) ශ්‍රී ලංකාවේ භූ විෂමතා කලාප තුන ඒවා වෙන් කරන උස සමඟ දක්වන්න. (ල. 03)

(ii) මීටර් 30 ට අඩු කලාපයේ දැකිය හැකි විශේෂ ලක්ෂණ දෙකක් පෙන්වා දෙන්න. (ල. 02)

(iii) ශ්‍රී ලංකාවේ ඇති සානු, කඳු වැටි හා දිය ඇලි දැක්වෙන වගුවක් සකස් කරන්න. (ල. 03)

(iv) ශ්‍රී ලංකාවේ භූ විෂමතාවය ආර්ථිකමය වශයෙන් වැදගත්වන ආකාරය පැහැදිලි කරන්න. (ල. 03)

03. (i) කාලගුණය හා දේශගුණය අතර වෙනස දක්වන්න. (ල. 02)

(ii) ශ්‍රී ලංකාවේ උෂ්ණත්ව වෙනස්කම්වලට බලපා ඇති හේතු තුනක් දක්වන්න. (ල. 03)

(iii) ශ්‍රී ලංකාවට වර්ෂාපතනය ලැබෙන ක්‍රම තුන ලැබෙන මාස සමඟ වගුගත කරන්න. (ල. 03)

(iv) පහත රට තෙත් කලාපීය දේශගුණයේ කැපී පෙනෙන ලක්ෂණ තුනක් පෙන්වා දෙන්න. (ල. 03)

04. (i) ආසියා මහද්වීපයේ සාපේක්ෂ පිහිටීම දක්වන්න. (ල. 02)

(ii) ආසියා මහද්වීපයේ නිරපේක්ෂ පිහිම දක්වන්න. (ල. 02)

(iii) ආසියා මහද්වීපයේ සුවිශේෂතා 04 ක් දක්වන්න. (ල. 04)

(iv) ආසියා මහද්වීපයේ භූ විෂමතාවය සම්බන්ධ කැපී පෙනෙන ලක්ෂණ තුනක් පෙන්වා දෙන්න. (ල. 03)

05. (i) පහත දේශගුණික කලාපවල ව්‍යාප්ත වනාන්තර වර්ග ඒ ඉදිරියෙන් දක්වන්න. (ල. 03)

- ★ අර්ධ ශුෂ්ක කලාපය -
- ★ පහත රට වියළි කලාපය -
- ★ කඳුකර තෙත් කලාපය -

(ii) පහත රට තෙත් කලාපයේ වනාන්තර තුනක් නම් කරන්න. (ල. 03)

(iii) ii හි දැක් වූ වනාන්තරවල දැකිය හැකි ලක්ෂණ දෙකක් දක්වන්න. (ල. 02)

(iv) දේශගුණ විවිධත්වය අපට වැදගත් වී ඇති ආකාරය කරුණු තුනකින් දක්වන්න. (ල. 03)

06. (i) එරල් මුහුදට ගලා බස්නා ගංගා දෙකක් නම් කරන්න. (ල. 02)

(ii) ආසියාවේ පිහිටි ප්‍රධාන විල් දෙකක් නම් කරන්න. (ල. 02)

(iii) ගංගාවන්ගෙන් ලබා ගන්නා ප්‍රයෝජන 03 ක් දක්වන්න. (ල. 03)

(iv) ආසියාවේ ජලවහන සම්බන්ධ සුවිශේෂතා දෙකක් පෙන්වා දෙන්න. (ල. 04)

07. (i) ආසියාවේ පිහිටි පැරණි මානව ශිෂ්ටාචාර දෙකක් නම් කරන්න. (ල. 02)

(ii) රූපයේ දැක්වෙන මානව වර්ග දෙක A, B පිළිවෙලින් නම් කරන්න. (ල. 02)



A


B

(iii) එම මානව වර්ග දෙක ව්‍යාප්ත රටවල් දෙක බැගින් දක්වන්න. (ල. 04)

(iv) එම මානව වර්ග දෙකෙහි වෙනස්කම් තුන බැගින් සංසන්ධනය කරන්න. (ල. 03)

08. (i) A, B හා C ලෙස දක්වා ඇති ආසියාවේ ජනාධික කලාප නම් කරන්න. (ල. 03)




(ii) ශ්‍රී ලංකාවේ ජනාධිකම දිස්ත්‍රික්ක දෙක හා ජන හීන දිස්ත්‍රික්ක දෙකක් දක්වන්න. (ල. 02)

(iii) ජන සංඛ්‍යාව සම්පතක් කරගත හැකි අයුරු කරුණු තුනක් ඇසුරින් දක්වන්න. (ල. 03)

(iv) තෙත් කලාපය ජනාධික වීමට හේතු තුනක් පෙන්වා දෙන්න. (ල. 03)

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 01 | 1 | 06 | ✓ | 11 | නිවර්තන මෝසම් | 16 | කැළණි ගඟ |
| 02 | 4 | 07 | ✓ | 12 | පතනශීලී | 17 | කාරීෆ් |
| 03 | 3 | 08 | × | 13 | ජපානය | 18 | පතන ශීඝ්‍රතාවය |
| 04 | 3 | 09 | × | 14 | අභ්‍යන්තර තැනිතලා | 19 | වාසුළි |
| 05 | 1 | 10 | ✓ | 15 | ගිණිකොණ | 20 | අර්ධ ශුෂ්ක |

(2 x 20 = ල. 40)

## II කොටස

01. (i) A - ප්‍රධාන මාර්ගය  B - බෞද්ධ සිද්ධස්ථානය (පන්සල)  C - ගංගාව
D - ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මායිම  E - රෝහල

(ii) නිවැරදි සංකේතවලට ලකුණු දෙන්න.

(iii) ගංගාව, වනාන්තර, ලඳු කැලෑ

(iv) කලපු, බොකු, තුඩු, දූපත්, ගංමෝය, ඩෙල්ටා, වැලි පර ....... ආදී.

(v) ගංගා, වැව්, පාළු වැව්, වාරිමාර්ග ඇල, ආදී......

02. (i) වෙරළබඩ තැන්න මීටර් 0 - 30, අභ්‍යන්තර තැනිතලාව - මීටර් 30 - 300, මධ්‍යම කඳුකරය මීටර 300 ට වැඩි

(ii) වෙරළ කලාපයක් පිහිටා තිබීම, තැනිතලා භූමිය, ගංගා වේගය අඩුය, ගංගා නිතර පිටාර ගලයි, ජනගහනය වැඩිය..... ආදී

(iii)

| කඳුවැටි | සානු | දියඇලි |
|---|---|---|
| නකල්ස් | මහනුවර | බඹර කන්ද |
| දොළොස්බාගේ | වැලිමඩ | දියළුම |
| පිදුරුතලාගල | හැටන් | දුන්හිඳ |
| හපුතලේ | කොස්ලන්ද | රාවනා |
| සමනල | මහවලතැන්න | බේකර්ස් |
| නමුණුකුල | | රම්බොඩ...... |

(iv)
- ★ මධ්‍යම කඳුකරය ස්වාභාවික සුන්දරත්වයෙන් අනූන බැවින් සංචාරක ආකර්ෂණය ඇතිවීම.
- ★ තේ, රබර්, එළවළු වැනි වගාවන්ට හිතකර වීම.
- ★ වෙරළබඩ ප්‍රදේශ ධීවර කර්මාන්තයට හිතකරවීම, තැනිතලා ප්‍රදේශ කෘෂිකාර්මික හා කාර්මික කටයුතුවලට යෝග්‍යවීම ආදිය....

03. (i) කාලගුණය යනු නිශ්චිත ස්ථානයක නිශ්චිත වේලාවක වායුගෝලයේ පවතින ස්වභාවයයි. දේශගුණය යනු කාලගුණික අංගයන්ගේ දිගුකාලීන හැසිරීමේ සාමාන්‍යයයි.

(ii) උන්නතාංශය, සාගරික බලපෑම, සුළං රටාවන්ගේ වෙනස්කම්, මහද්වීපවල බලපෑම ආදිය

(iii)

| මෝසම් | මෝසම් | වාසුළි |
|---|---|---|
| නිරිත දිග - මැයි සිට සැප්තැම්බර් දක්වා | මාර්තු, අප්‍රේල් මාස | ඔක්තෝම්බර් නොවැම්බර් මාස |
| ඊසාන දිග - දෙසැම්බර් සිට පෙබරවාරි දක්වා | | |

(iv) සාමාන්‍ය වාර්ෂික වර්ෂාපතනය මි. මී. 2000ට වැඩිය. සාමාන්‍ය වාර්ෂික උෂ්ණත්වය සෙ. අ. 27 ට වැඩිය. වසර පුරා ව්‍යාප්ත වර්ෂාපතනයක් ඇතත් නිරිතදිග මෝසම කාලය ප්‍රධාන වැසි කාලයයි.

04. (i) ආසියා මහද්වීපයේ සාපේක්ෂ පිහිටීම වනුයේ දකුණු අක්ෂාංශ $10^o$ සිට උතුරු අක්ෂාංශ $80^o$ දක්වාත් නැගෙනහිර දේශාංශ $25^o$ සිට $180^o$ දක්වාත් ය.

(iii) නිවර්තන දේශගුණයේ සිට කාන්තාර දේශගුණය දක්වා දේශගුණ විවිධත්වයක් පැවතීම. ලොව මහද්වීප අතරින් විශාලතම මහද්වීපය වීම. හින්දු, බෞද්ධ, කතෝලික ආදී ආගම් රැසක නිජබිම වීම. ලෝකයේ වැඩිම ජන සංඛ්‍යාවක් වෙසෙන මහද්වීප වීම හා ලෝකයේ ජනාධික කලාප වලින් තුනක් ම මෙහි පිහිටා තිබීම ආදී මානව වර්ග, භාෂා, ජාතීන් රැසක් පැවතීම. භූ විෂමතාවයේ සුවිශේෂත්වය ආදී කරුණු.

## පිළිතුරු පත්‍රය - ඉතිරි කොටස

(iv) ආසියාවේ භූ විෂමතාවය ගත්විට ලොව විශාලත ම කඳු පන්තිය වන හිමාලය වැටිය පිහිටා තිබීම, ලොව උස ම කඳු ශිඛරවලින් වැඩිම ප්‍රමාණයක් පිහිටා තිබීම. විශාලතම සානුව මෙන් ම ලොව උසින් ම පිහිටි ටිබෙට් සානුව පිහිටා තිබීම, මහා සයිබීරියානු තැන්න වැනි තැනිතලා පිහිටීම ආදී ලක්ෂණ.......

05. (i)
- ⋆ අර්ධ ශුෂ්ක කලාපය - කටු පඳුරු සහිත ලඳු කැලෑ
- ⋆ පහත රට වියළි කලාපය - වියළි මිශ්‍ර සදාහරිත වනාන්තර
- ⋆ කඳුකර තෙත් කලාපය - කඳුකර තෙත් කලාපීය වනාන්තර

(ii) සිංහරාජය, කන්නෙලිය, දෙදියගල, නාකියාදෙනිය, මොරපිටිය, බඹරබොටුව ආදී.....

(iii) පහත රට තෙත් කලාපීය වනාන්තරවල දැකිය හැකි විශේෂ ලක්ෂණ ලෙස ලඟා විය නොහැකි ලෙසින් ඝනව වැඩී තිබීම, ජෛව විවිධත්වය අධික වීම, වියන් හා නෙරූ ස්ථර පිහිටා තිබීම, අපි ශාක ඇතුළු යටි රෝපනය බහුලව ව්‍යාප්ත තිබීම, අඛණ්ඩව වැවෙන උස් ගස් පැවතීම ආදී........

(iv) දේශගුණ විවිධත්වය අපට වැදගත් වී ඇති ආකාරය සැලකීමේ දී විවිධ දේශගුණවල වැවෙන බෝග වර්ග පරිභෝජනයට අවස්ථා ලැබීම, කෙටි කාලයකින් විවිධ දේශගුණයන් අත් විඳීමට අවස්ථා ලැබීමෙන් සංචාරක ආකර්ෂණය ලැබීම, ජෛව විවිධත්වය ඉහළ අගයක් ගැනීමට හේතුවීම ආදී සාධක

06. (i) සර්ඩේරියා හා අමුඩේරියා

(ii) බොල්කැෂ් විල හා බයිකල් විල වැනි

(iii) කෘෂිකාර්මික කටයුතුවලට ජලය ලබා ගැනීම, ජල විදුලි බල උත්පාදනය, කාර්මික කටයුතු සඳහා අවශ්‍ය ජලය ලබා ගැනීම, මිරිදිය ධීවර කටයුතු සඳහා භාවිත කිරීම, ප්‍රවාහන අවශ්‍යතාවයන් සඳහා භාවිත කිරීම ආදී ..... ප්‍රයෝජන ගංගා වලින් ලබා ගත හැකිය.

(iv) සාගර ගණනාවකට ගලා බස්නා ගංගා පැවතීම, ලෝකයේ විශාල ගංගා බොහෝමයක් පිහිටා තිබීම, අභ්‍යන්තර මුහුදුවලට ගලා බස්නා ගංගා පැවතීම ආදීය උදාහරණ සමග දැක්වීම......

07. (i) ඉන්දු නිම්න ශිෂ්ටාචාරය, හොවැංහෝ නිම්න ශිෂ්ටාචාරය, මෙසපොතේමියානු ශිෂ්ටාචාරය

(ii) A - මොංගොලොයිඩ් B - කොකොසොයිඩ්

(iii) A - මොංගොලොයිඩ් - චීනය, කොරියාව, ජපානය පිලිපීනය ආදී .......

B - කොකොසොයිඩ් - ඉන්දියාව, පාකිස්ථානය, ලංකාව ආදී.....

(iv)

| මොංගොලොයිඩ් | කොකොසොයිඩ් |
|---|---|
| සම සුදු පැහැතිය. | තලෙලු වර්ණයෙන් යුක්තයි. |
| සාපේක්ෂ වශයෙන් මිටිය. | ශරීරය උසින් යුක්තය. |
| ඇස් ගිලී පවතී | දිගටි විශාල ඇස් ඇත. |
| මුහුණ රවුම්ය. | මුහුණ දිගටිය. |

08. (i) A අග්නිදිග ආසියාව (ගිනිකොණ) B - නැගෙනහිර ආසියාව C - දකුණු ආසියාව

(ii) ජනඩික - කොළඹ, ගම්පහ

ජනහීන - මුලතිව්, මන්නාරම්, වව්නියා, මොණරාගල වැනි

(iii) ජන සංඛ්‍යාවක් සම්පතක් බවට පත්කර ගැනීම සඳහා අධ්‍යාපන අවස්ථා පුළුල් කළ යුතුය. වෘත්තීය පුහුණු අවස්ථා ව්‍යාප්ත කළ යුතුය, නව නිපැයුම් සඳහා අවස්ථා උදාකර දිය යුතුය. විනය හා ආකල්ප සංවර්ධනය කළ යුතුය. නිරෝගී ජනතාවක් නිර්මාණය කළ යුතුය ආදී......

(iv) ශ්‍රී ලංකාවේ තෙත් කලාපය ජනාධික වීමට බලපා ඇති හේතු ලෙස යටිතල පහසුකම් වර්ධනය, සේවා අවස්ථා පුළුල් වීම, රැකියා අවස්ථා සුලභ වීම, පරිපාලන කේන්ද්‍රස්ථානයක් වීම ආදී හේතු.......